# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/88 - 2019 සැප්තැම්බර් මස 21 වැනි සෙනසුරාදා - 2019.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/8

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

(i) ගරු ජනක් ද සිල්වා මැතිතුමා
අභියාචනාධිකරණ විනිශ්චයකාර

(ii) ගරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා
අභියාචනාධිකරණ විනිශ්චයකාර

(iii) ගරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා
විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර

(iv) ගරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා
විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාර

(v) ඩබ්ලිව්.එම්.එම්. අධිකාරී මහත්මිය
විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්

වෙත,

ශුභාසිංශන පූර්වකවයි!

2019 අප්‍රේල් මස 21 වැනි දින කොළඹ කොච්චිකඩේ, මීගමුව කටුවාපිටිය යන කතෝලික දේවස්ථානවල, මඩකලපුව සියෝන් ක්‍රිස්තියානි දේවස්ථානය සහ කොළඹ පිහිටි ප්‍රධාන හෝටල් කිහිපයක සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර හේතුකොටගෙන, පුද්ගලයින් විශාල පිරිසකට මාරාන්තික තුවාල සිදුවීම්, පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම්, ජීවිත අහිමිවීම් මෙන්ම විශාල දේපළ ප්‍රමාණයකට අලාභ හානි සිදු වූ බැවින් ද;

ඉහත කී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරවල ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයින් රාශියකට ජීවිත අහිමිවීම්, පූර්ණ ආබාධිත තත්ත්වයන්ට පත්වීම්, තුවාල සිදුවීම් සහ දේපළ වලට අලාභ හානි සිදුවීම් වූ හෙයින්, ඊට ඍජුව හෝ වක්‍රව සම්බන්ධතා ඇතැයි සැලකෙන, රජයේ සේවකයින් / නිලධාරීන් වශයෙන් සිටි හෝ දැනට සිටින තැනැත්තන්ට හා වෙනත් තැනැත්තන්ට එරෙහිව ඔවුන් ගේ ක්‍රියා හෝ නොතකා හැරීම් පිළිබඳව බරපතල පැමිණිලි හා චෝදනා රාශියක් සිදුකර ඇති හෙයින් ද;

එකී ප්‍රහාරයන්ට ඍජුව හෝ වක්‍රව වගකිව යුතු අයවළුන්ට එරෙහිව නීතිය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතු බවට සහතික වීම කළයුතු වන හෙයින් ද;

ඉහත සඳහන් ආකාරයෙන් විවිධ වැරදි සහ බලය හෝ අධිකාරිය අනිසි ලෙස හෝ අයුතු ලෙස යොදා ගැනීම්, මගහැරීම්, අතපසුවීම්, නොසැලකිලිමත්කම්, වගකීම් පැහැරහැරීම් හා අකාර්යක්ෂමතා ආදී සිදුවී යැයි සලකනු ලබන ක්‍රියාවන් නැවත සිදු නොවන බවට සහතික වීම සඳහා විධිවිධාන සැලැස්වීමට කවර ක්‍රියා මාර්ග ගත යුතුද යන්න දැන ගැනීම සඳහා ඉහත කී සිද්ධි, පැමිණිලි, චෝදනා හා තොරතුරු පිළිබඳව විමර්ශන හෝ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සැලැස්වීම මහජන ආරක්ෂාව සහ සුභසාධනය පිණිස වන කරුණක් බව මගේ මතය වන හෙයින් ද;

මෙහි මින්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂා කොට, වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කළ යුතුයැයි මා අදහස් කරන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය, ස්වාධීනතාවය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරිය) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

(i) ගරු ජනක් ද සිල්වා මැතිතුමා
අභියාචනාධිකරණ විනිශ්චයකාර

(ii) ගරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා
අභියාචනාධිකරණ විනිශ්චයකාර

(iii) ගරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා
විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර

(iv) ගරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා
විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාර

(v) ඩබ්ලිව්.එම්.එම්. අධිකාරී මහත්මිය
විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂා කොට ඉදිරි නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට හැකිවනු පිණිස වාර්තා කිරීම සඳහා මාගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙයින් පත් කරමි.

1. 2019 අප්‍රේල් මස 21 වැනි දින, ජීවිතවලට හා දේපළවලට හානි ඇතිකරමින් සිදු වූ බෝම්බ ප්‍රහාරය හේතුකොට ගෙන ඇති වූ සිද්ධිය / සිද්ධිදාමයට ඍජුව හෝ වක්‍රව සම්බන්ධතා ඇතැයි සැළකෙන හෝ එකී සිද්ධිය / සිද්ධි දාමය සම්බන්ධයෙන් වූ විවිධ වැරදි සහ බලය හෝ අධිකාරිය අනිසි ලෙස හෝ අයුතු ලෙස යොදා ගැනීම්, මගහැරීම්, අතපසුවීම්, නොසැලකිලිමත්කම් හා අකාර්යක්ෂමතා, වගකීම් පැහැරහැරීම් ආදී සිදුවී යැයි සැලකෙනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන්, රජයේ සේවකයින් / නිලධාරීන් වශයෙන් සිටි හෝ දැනට සිටින තැනැත්තන්ට හා වෙනත් තැනැත්තන්ට එරෙහිව ඔවුන් ගේ ක්‍රියා හෝ නොතකා හැරීම් වලට අදාළ මහජන පැමිණිලි, තොරතුරු හා වෙනත් සාක්ෂි කැඳවීම සහ ඒවා ලබා ගැනීම,

2. ඉහත 1 වන ඡේදයේ සඳහන් පැමිණිලි, තොරතුරු හා චෝදනා පිළිබඳව කඩිනමින්, අපක්ෂපාත, සම්පූර්ණ විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම,

3. ඉහත 1 ඡේදයේ සඳහන් මෙම ත්‍රස්තවාදී ක්‍රියාවට සෘජුව හා වක්‍රව සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින් හා සංවිධාන හා ඒවායේ ක්‍රියා කලාපයන් හඳුනාගැනීම,

4. රට තුළ මෙවැනි ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියාදාමයක් සිදුවන බවට පූර්ව හඳුනාගැනීම, ඊට අනුශාංගික කරුණු සොයා බැලීම සහ නීතියට අනුව ක්‍රියා කිරීම සම්බන්ධ පැහැර හැරීම්, නොසළකා හැරීම් සහ නිසි ක්‍රියා මාර්ග නොගැනීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන්, බලධාරීන් හඳුනා ගැනීම,

5. 2019 අප්‍රේල් මස 21 වැනි දින ප්‍රහාරය සිදුවීම වළක්වා ගැනීමට සිය අතපසුවීම්, නොසළකාහැරීම්, රාජකාරි පැහැරහැරීම්, අකර්මණ්‍යතාවයන් හේතුවෙන් නිසි ක්‍රියා මාර්ග නොගැනීම සම්බන්ධව එයට වගකිව යුතු සියළු බලධාරීන් හඳුනා ගැනීම,

6. 2019 අප්‍රේල් මස 21 වැනි දින ත්‍රස්ත ප්‍රහාර සිද්ධියෙන් පසුව රට තුළ ඇතිවුන මහජන උද්ඝෝෂණ, කඩාකප්පල්කාරී ක්‍රියා, දේපළ හා පුද්ගල හානි සිදු කිරීම තුළින් මහජන කැළඹීලි ඇති කිරීමට සම්බන්ධ වූ පුද්ගලයින් හා සංවිධාන හඳුනා ගැනීම,

7. රට තුළ ජාතිවාදී හා ආගම්වාදී ආරවුල් ඇතිවීමට හේතුවන්නා වූ, මහජනයා කුපිත කරවන්නා වූ, සමාජ යහපැවැත්මට බාධාවන්නා වූ, සමාජ ඒකාබද්ධතාවයට හානිවන්නා වූ, ජාතිවාදී හා ආගම්වාදී ප්‍රවණතා ඇතිකරවන්නා වූ ක්‍රියාදාමයන් සඳහා අනුබල දෙන, අනුග්‍රහය දක්වන පුද්ගලයින්, සංවිධාන හා ක්‍රියාවලීන් හඳුනා ගැනීම,

8. (අ) පුද්ගලයන්ට මරණය, පූර්ණ ආබාධිත තත්ත්වය හෝ තුවාල සිදුකරමින්

(ආ) යම් රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට, ආගමික ස්ථානයකට, පුද්ගලික ආයතනයකට අයත් හෝ සන්තකයේ ඇති දේපළ විනාශය හෝ අලාභය සිදු කරමින්

2019 අප්‍රේල් මස 21 වැනි දින දිවයින පුරා සිදු වූ සිදුවීම් වලට හේතුවූ අවස්ථානුගත කරුණු, හේතු සහ ස්වභාවය දැන ගැනීම,

9. යම් තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්, නැතහොත් එම සංවිධානය හා සම්බන්ධ යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් (1) වන ඡේදයේ සඳහන් ක්‍රියා -

(අ) සිදු කළේ ද හෝ සිදු කිරීමට කුමන්ත්‍රණය කළේ ද ;

(ආ) එම ක්‍රියා සිදු කිරීමට මූල්‍යමය / භෞතික හා මානසික වශයෙන් ආධාර හෝ අනුබල දීම් කළේ ද, නැතහොත් එම ක්‍රියා කිරීමට ආධාර හෝ අනුබලදීමට කුමන්ත්‍රණය කළේ ද ;

(ඇ) එම ක්‍රියා සිදු කිරීමට යම් ආකාරයකින් සහාය දුන්නේ ද, දිරි දුන්නේ ද හෝ එම ක්‍රියා සිදු කිරීමට සම්බන්ධවී සිටියේ ද හා ඊට කුමන්ත්‍රණය කළේ ද සහ දිරි දුන්නේ ද ; හා

(i) එම ක්‍රියාවලියෙන් හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමට හෝ වෙනත් යම් ආකාරයකින් සහය වීමට අවශ්‍ය නම් යම් පියවර නිර්දේශ කිරීම,

(ii) මහජනතාව ගේ ආරක්ෂාව පිළිබඳව සහතික වීමට අවශ්‍ය පියවර නිර්දේශ කිරීම,

(iii) එවැනි සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීමට අවශ්‍ය පියවර නිර්දේශ කිරීම

10. ඉහත කී වැරදි සිදු කළ බවට සැක කරනු ලබන තැනැත්තන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ අදහස ඇතිව අවශ්‍ය විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම සඳහා අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලීසියට හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියකට ඉදිරිපත් කළ යුත්තේ ඉහත සඳහන් කරුණුවල විෂය පථය තුළට වැටෙන ක්‍රියාවලින් කවර ක්‍රියාද යන්න හඳුනා ගැනීම,

11. ඉහත කී වැරදි සිදුකළා යැයි කියනු ලබන තැනැත්තන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම සළකා බැලීමට නීතිපතිවරයාට හැකිවන පරිදි විමර්ශනයට සහ පරීක්ෂණයට අදාළ සාක්ෂි නීතිපතිවරයාට ප්‍රේෂණය කිරීම,

12. ඉහත වැරදි හෝ වැරදි ක්‍රියා සිදු කිරීම සඳහා වගකිව යුතු තැනැත්තන්ට එරෙහිව ගත යුතු ක්‍රියා මාර්ග ඇත්නම් ඊට අදාළව නීති ප්‍රකාරව කටයුතු කිරීම සඳහා එම ක්‍රියා මාර්ග සම්බන්ධව කොමිෂන් සභාවේ නිර්දේශ සහ අනාගතයේ දී එවැනි වැරදි හා වැරදි ක්‍රියා සිදු වීම වැළැක්වීම සඳහා ගත යුතු නිර්දේශ මා වෙත ඉදිරිපත් කිරීම,

13. මෙවැනි ත්‍රස්තවාදී, අන්තවාදී ක්‍රියාවන් මගින් ජාතික ආරක්ෂාවට හා ජාතික සමගියට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම සඳහා ගත යුතු පියවරයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම,

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු ජනක් ද සිල්වා වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පෙර කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයැයි ඔබට පෙනී යා හැකි සාපරාධී හා වෝහාරික විමර්ශන පැවැත්වීමට හෝ පැවැත්වීමට සලස්වාලීම සහ සියළුම ප්‍රසිද්ධ සහ / හෝ රහස්‍ය හෝ විමර්ශන හෝ පරීක්ෂණ කිරීමට ද ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් බලය හා අධිකාරය පවරන අතර, මේ අධිකාරි පත්‍රයෙහි දින සිට තෙමසක් ඇතුළත පළමු වැනි අතුරු වාර්තාව ද, ඊට අනතුරුව දෙමසකට වරක් අතුරු වාර්තා ද මෙහි සඳහන් දින සිට මාස හයක් ඇතුලත ඔබේ විමර්ශනයන්හි සහ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබේ නිර්දේශයන් ඇතුළත් අවසන් වාර්තාව ද ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, මෙම කොමිෂන් සභාවේ රැස්වීම්වල ගණපූරණය සඳහා ඔබ අතුරින් ඕනෑම කොමසාරිස්වරුන් තිදෙනෙකු සහභාගි විය යුතු යැයි මම ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණාවලට අදාළ වන කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියළුම රජයේ හා ත්‍රිවිධ හමුදා නිලධරයන්, සංස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියළුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියළුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ඉහත කී 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 අධිකාරය) 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහනවයක් වූ සැප්තැම්බර් මස 20 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

10 - 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.